## 1. ව්‍යාපෘතියේ පසුබිම

කාන්තා,ළමා කටයුතු හා සමාජ සවිබලගැන්වීම් අමාත්‍යංශය (MOWCASE) වනිතා සංවර්ධන නිළධාරීන් හා වනිතා සංවර්ධන ක්ෂේත්‍ර සහකාරවරියන් හරහා කාන්තා දේශපාලන සහභාගීත්වය,ආර්ථික සවිබල ගැන්වීම, ස්ත්‍රී පුරුෂ සමාජ භාවය පදනම් කරගත් හිංසනය තුරන් කිරීම සඳහා අවශ්‍ය ප්‍රවේශ පහසුකම් ලබා දී ඇත.තවද, සමානාත්මතාවය හා කාන්තා සවිබල ගැන්වීම ප්‍රවර්ධනය සඳහා ප්‍රජාව තුළ කාන්තාවන් සංවිධානය කරමින් ග්‍රාම නිළධාරී වසම් මට්ටමෙන් කාන්තා කාර්ය සංවිධානද (WAS) පිහිටුවා ඇත.

වර්තමානයේ පවතින තත්වයන් සලකා බලන විට කාන්තාවන් ආර්ථික වශයෙන් සවිබලගැන්වීම සඳහා විවිධ ක්‍රියාකරකම් සැලසුම් කිරීමට හා ක්‍රියාත්මක කිරීම සඳහා වනිතා සංවර්ධන නිළධාරීන්ගේ හා වනිතා සංවර්ධන ක්ෂේත්‍ර සහකාර නිළධාරීන්ගේ ධාරිතාවය තවදුරටත් වර්ධනය කළ යුතුවේ.මීට අමතරව,කාන්තා කාර්ය සංවිධානයන්හි ක්‍රියාකාරීත්වයද මේ වන විට යම් තරමක් දුරට සීමා වී ඇති බැවින්, වඩා හොඳ ස්ත්‍රී පුරුෂ සමානාත්මතාවය තහවුරු කරන සමාජයකට මෙමගින් සිදුකරන බලපෑම අඩු මට්ටමක පවතී. එබැවින්,වනිතා සංවර්ධන නිළධාරීන් හා වනිතා සංවර්ධන ක්ෂේත්‍ර සහකාරවරියන් සඳහා ප්‍රජාව තුළ කාන්තාවන් බලමුළු ගන්වමින් විවිධ පාර්ශවකරුවන් සමග ඇති හවුල්කාරීත්වය ශක්තිමත් කිරීම තුළින් කාන්තාවන්ට ඵලදායීව සහයෝගය ලබා දීමට අවශ්‍ය ධාරිතාව වැඩි දියුණු කළ යුතුවේ.එමගින්,විවිධ භාහිර පාර්ශව සමග ඇති හවුල්කාරීත්වය ශක්තිමත් කිරීම, කාන්තාවන්ගේ අවශ්‍යතා සඳහා ආමන්ත්‍රණය කිරීම, ආර්ථික බලගැන්වීම, ලිංගිකත්වය මත පදනම් වන හිංසනය වැලැක්වීම,ස්ත්‍රී පුරුෂ සමාජ භාවීය ගැටළු ආදිය විසඳීම සඳහා ඔවුන්ගේ මැදිහත්වීම වඩා ශක්තිමත් කිරීමද මෙම ව්‍යාපෘතියේ අරමුණවේ.






## 5. ව්‍යාපෘති කාර්යාල




***<u>කොළඹ</u>***

ශ්‍රී ලංකා කාන්තා කාර්යංශය කාන්තා ළමා කටයුතු සහ සමාජ සවිබල ගැන්වීම් අමාත්‍යංශය



***<u>අම්පාර</u>***

දිස්ත්‍රික් ලේකම් කාර්යාලය-අම්පාර

✉ ampara.srilanka.wee@gmail.com



***<u>මොණරාගල</u>***

දිස්ත්‍රික් ලේකම් කාර්යාලය මොණරාගල

✉ monaragala.srilanka.wee@gmail.com

---

ජපාන ජාත්‍යන්තර සහයෝගිතා නියෝජිත ආයතනය (JICA) යනු ජපානයේ ද්වීපාර්ශවික නිල සංවර්ධන ආධාර (ODA) ක්‍රියාත්මක කරන ආයතනයයි. JICA ලොව විශාලතම ද්වී පාර්ශවික ආධාර නියෝජිත ආයතනය වන අතර, රටවල් සහ කලාප 150කට වැඩි ප්‍රමාණයකට සේවය සලසනු ලබයි. ශ්‍රී ලංකාව තුළ ජපානය 1954 සිට ODA ණය, ප්‍රදාන,ආධාර සහ තාක්ෂණික සහයෝගීතාවය හරහා ලබා දෙමින් ශ්‍රී ලංකාවවේ විශාලතම අරමුදල් සපයන්නන්ගෙන් අයෙක් වශයෙන් කටයුතු කරයි.ජපානයේ ජනතාව හා රජය වෙනුවෙන් JICA ශ්‍රී ලංකාවේ ජන ජීවිතය වැඩි දියුණු කිරීමටද දායක වේ.

---

## ක්‍රියාත්මක කිරීමේ නියෝජිත ආයතනය

**ශ්‍රී ලංකා කාන්තා කාර්යාංශය,**

**කාන්තා, ළමා කටයුතු හා සමාජ සවිබලගැන්වීම් අමාත්‍යංශය**

3 වන මහල, සෙත්සිරිපාය ii අදියර, බත්තරමුල්ල

✉ secretary@childwomenmin.gov.lk

www http://www.childwomenmin.gov.lk/

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය

# කාන්තා ආර්ථික බලගැන්වීම තුළින් ව්‍යවසායකත්වය, නායකත්වය සහ ජාලකරණය සඳහා වන ව්‍යාපෘතිය

2023-2027

දෙසැම්බර් 2023



## 2. ව්‍යාපෘතියේ දළ සටහන

***සමස්ථ ඉලක්කය***

ව්‍යාපෘතිය මගින් සංවර්ධනය කරනු ලබන කාන්තා ආර්ථික සවිබලගැන්වීම සඳහා වන ව්‍යාපෘති ආකෘතිය(මොඩලය) ඉලක්කගත දිස්ත්‍රික්කවලින් ඔබ්බට වෙනත් ප්‍රදේශ සඳහා ද භාවිතා කිරීමට කටයුතු කිරීම

***ව්‍යාපෘතියේ අරමුණ***

ව්‍යවසායකත්වය, කාන්තා සංවර්ධන නායකත්වය හා ජාලකරණය වැඩි දියුණු කිරීම තුළින් කාන්තා ආර්ථික සවිබල ගැන්වීම සඳහා වන ව්‍යාපෘති ආකෘතිය(මොඩලය) ආයතනගත කිරීම.

***ප්‍රතිදාන (INPUTS)***

1. ඉලක්ක ගත දිස්ත්‍රික්කවල නියමු ක්‍රියාකාරකම් ක්‍රියාත්මක කිරීමට හවුල්කරුවන් සහ සම්පත් හඳුනා ගැනීම.
2. කාන්තා ව්‍යවසායකත්ව සහ ව්‍යාපාර සංවර්ධනය,ජාලකරණය ශක්තිමත් කිරීම සඳහා නියමු ක්‍රියාකාරකම් තුළින් උගත් දැනුම යහපත් භාවිතයන් සහ පුරුදු සත්‍යාපනය කෙරේ.
3. නියමු ව්‍යාපෘතිය මගින් ව්‍යවසායකත්ව සංවර්ධනය සහ කාන්තා නායකත්වය ජාලකරණය වැඩි දියුණු කිරීම තුළින් කාන්තා ආර්ථික සවිබල ගැන්වීම සඳහාවන ආකෘති නිර්මාණය කිරීම.
4. ව්‍යාපෘති ආකෘතිය(මොඩලය) ක්‍රියාත්මක කිරීම සඳහා කාන්තා කාර්යංශයේ සහ වනිතා සංවර්ධන නිළධාරීන්/ වනිතා සංවර්ධන ක්ෂේත්‍ර සහකාර නිළධාරීන්ගේ ධාරිතාව හා ක්‍රියාත්මක කිරීමේ ක්‍රමවේද වැඩි දියුණු කරනු ලැබේ.
   - කාන්තා කාර්ය සංවිධාන ක්‍රියාත්මක කිරීමේ සංරචකය
   - ව්‍යාපෘති ආදර්ශ ආකෘතිය ආයතනීකරණය කිරීමේ සංරචකය

***ව්‍යාපෘති ප්‍රදේශ***

කොළඹ, අම්පාර දිස්ත්‍රික්කය මොණරාගල දිස්ත්‍රික්කය

***ව්‍යාපෘති කාලය***

2023 මාර්තු සිට 2027 මාර්තු දක්වා





## 3.ව්‍යාපෘතියේ ක්‍රියාකාරකම් ප්‍රවාහය




## 4 . ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමේ ව්‍යුහය

